**02**
**පාඩම**
**द्वितीयः पाठः**

# ස්වර ප්‍රභේද හඳුනා ගනිමු

*වෙනත් අක්ෂරයක උපකාරයක් නොමැති ව තනි තනි ව උච්චාරණය කළ හැකි අකුරු 'ස්වර' නම් වේ. ස්වර අක්ෂර මාලාවේ ප්‍රභේද පිළිබඳ තොරතුරු මෙහි දී ඔබට හඳුනා ගැනීමට හැකි වනු ඇත. ඒවා මැනවින් මතකයේ තබාගන්න.*

## स्वर ( ස්වර )

සංස්කෘත ස්වර දහතරකි (14)කි.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| अ | आ | इ | ई | उ | ऊ | ऋ |
| ॠ | ऌ | ॡ | ए | ऐ | ओ | औ |

සංස්කෘත භාෂාවේ ස්වර මාලාව කොටස් දෙකකට (2) බෙදා දැක්විය හැකි ය. එනම්;

1. ह्रस्व ( හ්‍රස්ව )
2. दीर्घ ( දීර්ඝ ) යනුවෙනි.

**මෙම ප්‍රභේද දෙක පිළිබඳ සවිස්තර තොරතුරු පහත දැක්වේ.**

### 01. ह्रस्व (හ්‍රස්ව)

උච්චාරණයේ දී ඇදී නොකියවෙන, ඒක මාත්‍රාවක් ඇති ස්වර අක්ෂර 'හ්‍රස්ව ස්වර' නම් වේ. මේවා ගණනින් (5) පහකි .

अ इ उ ऋ ऌ

### 02. दीर्घ ( දීර්ඝ )

ඇදී කියවෙන, මාත්‍රා දෙකක් ඇති ස්වර දීර්ඝ ස්වර නම් වේ. ඒවා ගණනින් (9) නවයකි.

आ ई ऊ ॠ ॡ ए ऐ ओ औ

## 2.1 අභ්‍යාසය

(i) දේවනාගරී අක්ෂර මාලාවට අයත් සියලු ස්වර අක්ෂර පිළිවෙළින් ලියන්න. (මෙහි දී ''සිංහල - පාලි'' අක්ෂර මාලාවල 'ස්වර' සමග සසඳන්න)

(ii) ස්වරවලට අදාළ ව (ස්වරවලින් පටන් ගන්නා) සංස්කෘත වචන 02 බැගින් එකතු කරන්න.

## 2.2 අභ්‍යාසය

1.

**(i) පහත සඳහන් වචන දේවනාගරී අකුරින් ලියන්න.**

1. අගධ (බෙහෙත්)
2. ආරාම (ආරාමය)
3. ආවාට (වළ)
4. කදලී (කෙසෙල්)
5. උත්තර (උතුර)
6. උලූක (බකමූණා)
7. ඍග්වෙද (ඍග්වේදය)
8. කොකිල (කොවුලා)
9. ලග්න (ලග්නය)
10. ප්‍රාකාර (ප්‍රාකාරය)
11. පුෂ්ප (මල)
12. ඓශ්වර්‍ය (ඉසුරුමත්)
13. ඕදන (බත්)
14. පෞරාණික (පැරණි)

**(ii) පහත සඳහන් වචන සිංහල අකුරින් ලියන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| १ | नर | (මිනිසා) | २ | नायक | (නායකයා) |
| ३ | अतिथि | (ආගන්තුකයා) | ४ | नदी | (නදිය) |
| ५ | गुरु | (ගුරුවරයා) | ६ | उलूखल | (වංගෙඩිය) |
| ७ | नृपति | (රජතුමා) | ८ | कृपण | (අසරණයා) |
| ९ | नालिकेर | (පොල්ගස) | १० | कौमुदी | (සඳරැස්) |
| ११ | वैशाख | (වෙසක්) | १२ | कपोत | (පරවියා) |
| १३ | हैरिक | (හොරා) | १४ | नौका | (කුඩා නැව, ඔරුව) |
| १५ | मौन | (නිහැඬියාව) | | | |

2. සංස්කෘත අක්ෂර මාලාවේ ස්වර ප්‍රභේදයන් සහ ඊට අදාළ අක්ෂර වගුගත කොට දක්වන්න (ගුරුවරයාගේ උපදෙස් අනුගමනය කරන්න).

| ස්වර මාලාව | ह्रस्व | दीर्घ |
|---|---|---|
| ........ | ........ | ........ |

භාවිතයට

सर्वभाषासु या श्रेष्ठा - या चाढ्या शास्त्रसंचयैः ।
श्रेयं संस्कृतभाषा ते - भूयाद् वृद्ध्यै शिवाय च ॥

සියලු භාෂාවන් අතර උතුම් වූ ද ශාස්ත්‍ර සමූහයෙන් පොහොසත් වූ ද සංස්කෘත භාෂාව ඔබේ දියුණුව හා යහපත පිණිස වේවා !